## ප්‍රස්තාවනාව

පසුගිය දශක දෙක ඇතුළත ශ්‍රී ලංකාවේ සමාජ වෙනස් වීම තුළ වර්ධනය වූ අනෝමියත්වය සහ එහි ප්‍රතිඵල නම් වූ මෙම පර්යේෂණාත්මක නිබන්ධය රුහුණ විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන්නකි.

සමාජවිද්‍යාව බටහිර යුරෝපා සමාජයේ කාර්මික විප්ලවය සහ ප්‍රංශ විප්ලවය ඇතුළු සමාජ වෙනස්වීම් මුල් කරගෙන ආරම්භ වූ විෂයකි. ඒ මීට සියවස් එකහමාරකට පෙර ය. ශ්‍රී ලාංකික සමාජවිද්‍යාවේ ආරම්භය පසුගිය සියවස මැද භාගය දක්වා දිව යයි. එසේ වුව ද ලාංකික සමාජවිද්‍යාව තුළ ව්‍යවහාරික නැඹුරුවක් ඇති වන්නේ 1970 දශකයෙන් පසුව ය. සමාජ පර්යේෂණ සඳහා සමාජවිද්‍යාව විෂය තුළ හිමි වන්නේ ඉතා වැදගත් ස්ථානයකි. ඊට හේතුව එම පර්යේෂණයන් විෂයෙහි විකාශනය සඳහාත්, මානව වර්ගයාගේ යහපත සඳහාත්, හේතු වන බැවිනි.

එංගලන්තය, ප්‍රංශය හෝ ජර්මනිය වැනි බටහිර යුරෝපා සමාජවල මෙන් ම ඇමෙරිකා එක්සත් ජනපදය වැනි සමාජවල ද ධනවාදයේ නැගීමත් සමග සිදු වූ සමාජ වෙනස් වීම සමාජීය මිනිසාගේ චින්තනය සහ චර්යාව කෙරේ කවර ආකාරයේ බලපෑම් සිදු කර තිබේද යන්න පිළිබඳ ව විවිධ මට්ටමේ සමාජ පර්යේෂණ සිදු කර තිබේ. අනෝමියත්වය පිළිබඳ න්‍යාය ගොඩ නැගී ඇත්තේ එම අධ්‍යයනයන් හි ප්‍රතිඵල හැටියට යි. එකී සමාජයන් හි අපගාමීත්වය තේරුම් ගැනීමේ දී මේ අනෝමියත්වය නම් සංකල්පය භාවිත කර ඇත.

ලංකා සමාජයේ මෑත කාලීනව ඇති වූ විශාලතම සමාජ වෙනස් වීම 1977 ආරම්භ කරන ලද විවෘත ආර්ථික ක්‍රමය සමග බැඳී ඇති බව ප්‍රකට කාරණයකි. පැවති තත්ත්වයන්ට සාපේක්ෂව බලන විට විවෘත ආර්ථිකය අරඹා දශක දෙකක් ඇතුළත එනම් 1978-1998 වකවානුව තුළ ලංකා සමාජයේ ධර්මතා බිඳ දමන, ප්‍රතිමාන නොතකාහරින සමාජය අනුමත නොකළ අපගාමී චර්යාවන්ගේ අසීමිත වර්ධනයක් සිදු වූ බව ඉතා පැහැදිලි ය. විශේෂයෙන් මේ කාලය තුළ මිනිස් ඝාතන, ස්ත්‍රී දූෂණ, මංකොල්ලකෑම් සහ සොරකම්, මත් පැන් හා මත් ද්‍රව්‍ය, ගණිකා වෘත්තිය , සියදිවි හානි කර ගැනීම් ඇතුළු අපගාමී චර්යාවන්ගේ ශීඝ්‍ර වර්ධනයක් සිදු විය. ඒ අනුව මෙම පර්යේෂණයෙන් මූලික වශයෙන් අපේක්ෂා කෙරෙන්නේ විවෘත ආර්ථිකයත් සමග ලංකා සමාජයේ සිදු වූ සමාජ වෙනස් වීම් හඳුනා

ගැනීමත්, 1978-1998 දශක දෙක තුළ වර්ධනය වූ අපගාමී චර්යාවන් අනෝමියත්වය නම් සංකල්පය ඇසුරින් තේරුම් ගත හැකි දැ යි විමසා බැලීමත් ය.

ලාංකික සමාජවිද්‍යාව තවමත් වර්ධනීය අවධියක පසුවන බැවින් මෙවැනි පර්යේෂණයන්හි විරල බවක් දක්නට ඇත. න්‍යාය ආශ්‍රිත පර්යේෂණ අසීරු හා ක්‍රමවේදීය වශයෙන් ගැටළු සහගත බව පිළිගැනේ. එසේ වුව ද සමාජ වෙනස්වීම සහ අපගාමීත්වය විමසා බලන මෙවැනි පර්යේෂණ නූතන ශ්‍රී ලංකා සමාජය ඇසුරින් ගත් විට කාලීන වශයෙන් අත්‍යවශ්‍ය හා අතිශය වැදගත් ඒවා බව පැහැදිලි ය.

මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයේ මාතෘකාව සකස් කර ගැනීමේ සිට වාර්තාව ලියා නිම කරන තෙක් ම අපේක්ෂා කළ හා නොකළ විවිධ ගැටළු සහ බාධක රැසක් මතු වුව ද ඒවා හැකිතාක් දුරට මැඩලමින් පර්යේෂණය අවසන් කිරීමට හැකි වීම සතුටට කරුණකි. මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයේ උපදේශකවරයා ලෙස කටයුතු කරමින් පශ්චාත් උපාධි අධ්‍යයනයක දී විද්‍යාර්ථියකු මුහුණ දෙන විෂය බද්ධ හා පර්යේෂණාත්මක ගැටළු විසඳා දෙමින් සාර්ථක ලෙස පර්යේෂණ කටයුතු නිම කර ගැනීමට නිසි මාර්ගෝපදේශකත්වය සැපයූ රුහුණ විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අධ්‍යයනාංශයේ අංශයාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඒ. කේ. ජී. ජයසිංහ මහතාගෙන් ලැබුණු අනුග්‍රහය ප්‍රථමයෙන් ම ගෞරව පූර්වකව සිහිපත් කරමි.

මෙම අධ්‍යයන කාර්යය සාර්ථක කර ගැනීම සඳහා මා ධෛර්යමත් කරමින් සෑම අංශයකින් ම සහාය දුන් රුහුණ විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මීන්ගෙන් ලද සහයෝගය ද ස්තුති පූර්වකව අගය කරමි. නිබන්ධයේ ව්‍යාකරණ දෝෂ නිවැරදි කර දෙමින් සහාය වූ සිංහල අධ්‍යයනාංශයේ එස්. මානවඩු සහ සුගත් පුංචිහේවා යන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරුන් දෙපළ ද කෘතඥ පූර්වකව සිහිපත් කළ යුතු ය. නිබන්ධයේ ඇතුළත් සංඛ්‍යාන වගු සහ සිතියම් සකසා ගැනීමට සහාය වූ භූගෝලවිද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එස්. එල්. ජේ. ප්‍රනාන්දු සොයුරාට ද ස්තුතිවන්ත වෙමි. පරිවර්තන කටයුතුවල දී සහාය දැක් වූ කථිකාචාර්ය තිලක් විජේසුන්දර සහ නිබන්ධය පරිගණකගත කර ගැනීමට සහාය වූ කථිකාචාර්ය බන්දුල රාජපක්ෂ යන මහත්වරුන්ගේ සම්මාදම හා කැප වීම ද ගෞරවයෙන් සිහිපත් කරමි. නම් වශයෙන් සඳහන් නොකළ ද මේ පර්යේෂණයේ දත්ත රැස් කර ගැනීමේ දී හා වෙනත් කටයුතුවල දී නන් අයුරින් සහාය දුන් සැමට මාගේ විශේෂ ස්තුතිය පිරිනැමේ.